# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO
1096/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
04/07/2024
පැය 0935

## මාධ්‍ය නිවේදනය

**01. වැටලීමකට ගිය පොලිස් නිලධාරීන්ට පහර දී රාජකාරියට බාධා කළ සැකකරුවන් තිදෙනෙකු හා සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට - තලාව පොලිස් ස්ථානය.**

2024.07.03 වන දින රාත්‍රී කාලයේ තලාව පොලිස් වසමේ සුමුදුගම ප්‍රදේශයේදී තලාව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් නීති විරෝධි මත්පැන් අළෙවි කරන බවට ලද තොරතුරක් මත වැටලීම් රාජකාරි නිරතව සිටියදී පුද්ගලයෙකු විසින් එම නිලධාරීන්ට බැන තර්ජනය කර මන්නා පිහියක් රැගෙන පහර දීමට උත්සහා කර ඇති අතර වැටලීම් නිලධාරීන් විසින් ඒ සම්බන්ධව පොලිස් ස්ථානය දැනුවත් කිරීමෙන් පසු තලාව ස්ථානාධිපතිවරයා ඇතුළු පිරිසක් ස්ථානයට ගොස් ඇත.

එම අවස්ථාවේදී කලහකාරි හැසුරුනු පුද්ගලයකු විසින් මන්නා පිහියකින් ස්ථානාධිපතිවරයාට පහර දීම හේතුවෙන් ඔහු බරපතල තුවාල ලබා ඇති අතර එම ස්ථානයේ සැකකරු සමඟ සිටි තවත් පුද්ගලයින් කිහිපදෙනෙකු විසින් ද වැටලීම් නිලධාරීන්ට පහරදීම හේතුවෙන් නිලධාරීන් තිදෙනෙකු තුවාල ලබා ඇත. සැකකරු විසින් නැවත ජීව අත්බෝම්බයකින් පොලිස් නිලධාරීන්ට දමා ගැසීමට උත්සහා කරන අවස්ථාවේ නිලධාරීන් විසින් එය වළක්වා ජීව අත්බෝම්බයද සමඟ සැකකරු අත්අඩංගුවට ගැනීමට කටයුතු කරන ලදී.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන සුමුදුගම, තලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

සිදුවීමෙන් පසු අනෙක් සැකකරුවන් ස්ථානයෙන් පලාගොස් ඇති අතර එම සැකකරුවන් දෙදෙනෙකු හා සැකකාරියන් දෙදෙනෙකු තලාව පොලිස් ස්ථානය මගින් අත්අඩංගුවට ගැනීමට කටයුතු කරන ලදී.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් හා සැකකාරියන් අවරුදු 26,30 හා 44 වයස් වල පසුවන සුමුදුගම, තලාව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මන්නා පිහියෙන් පහරදීම හේතුවෙන් තුවාල ලැබූ ස්ථානාධිපතිවරයා හා තවත් නිලධාරීන් තිදෙනෙකු ප්‍රතිකාර සඳහා තලාව රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව ස්ථානාධිපතිවරයා වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහලට මාරු කර යවා ඇත. සිද්ධියට සම්බන්ධ තලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. හදිසි අනතුරකින් දැරියක් මිය යාම - පානදුර දකුණ පොලිස් වසම.

2024.06.23 වන දින පානදුර දකුණ පොලිස් වසමේ බොක්කේගම ප්‍රදේශයේ පැවැති දන්සලක් අවසානයේ කල්දේරමක ඉතිරි වූ කරවල ව්‍යංජනක් පසු දින ආහාරයට ගැනීම සඳහා නැවත රත් කර තිබියදී එම නිවසේ සිටි දැරියක් පසු පසට ඇවිද ගොස් එම කල්දේරම තුළට වැටීම හේතුවෙන් පිළිස්සුම් තුවාල ලබා ප්‍රතිකාර සඳහා පානදුර රෝහලට ඇතුලත් කර ඇත.

මෙම දැරිය 2024.06.27 වන දින  වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ රිජ්වේ ආර්යා රෝහලට මාරු කර යවා ඇති අතර රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී 2024.07.02 වන දින උදෑසන මියගොස් ඇත.

**මියගිය දැරිය වයස අවුරුදු 08 මාස 08 ක් වන බොක්කේගම, පානදුර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත දේහය සම්බන්ධයෙන් පශ්චාත් මරණ පරීක්ෂණ සිදුකර ඇති අතර මරණයට හේතුව පිළිස්සුනු තුවාල වලට විෂබීජ ඇතුළුවීමෙන් සිදු වූ මරණයක් බවට වෛද්‍යවරුන් ප්‍රකාශ කර මෘත දේශය ඥාතීන්ට භාර දී ඇත.

ඔබගේ කුඩා දරුවන් පිළිබඳව හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධව දෙමව්පියන් නිරන්තර අවධානයෙන් සිටිය යුතු අතර එමඟින් මෙවැනි හදිසි අනතුරු වළක්වා ගැනීමට හැකියාව පවතී. පානදුර දකුණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. විෂ සහිත ද්‍රාවණයක් පානය කර මියගිය ධීවරයන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කිරීම  - තංගල්ල පොලිස් ස්ථානය.

තංගල්ල ධීවර වරායෙන් ධීවර කටයුතු සඳහා පිටව ගිය ඩෙවෝන් 05 බහුදින ධීවර යාත්‍රාවේ සිටි ධීවරයින් ගැඹුරු මුහුදේදී විෂ සහිත ද්‍රාවණයක් පානය කිරීමෙන් මියගිය අයගේ  මෘත දේහයන් 2024.07.03 වන දින උදෑසන තංගල්ල ධීවර වරාය වෙත රැගෙන එන ලදී.

එම ධීවරයින් සිව්දෙනාගේ මෘත ශරීර සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණයක් සිදු කිරීමෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු තංගල්ල රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා  විසින් සිදු කර ඇති අතර එහිදී මෙම මරණයන් සම්බන්ධව විවෘත තීන්දුවක් ලබාදී මෘත දේහයන්  ඥාතින් වෙත භාරදීමට කටයුතු කර ඇත.

තංගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. රිය අනතුරක්  - අලදෙනිය  පොලිස් වසම.

2024.07.03 වන දින දහවල් කාලයේ අලදෙනිය පොලිස් වසමේ නුගවෙල පාසල් හන්දියේදී මහනුවර දෙසට ධාවනය වූ ලොරි රථයක් මාර්ගයේ විරුද්ධ දිසාවට හැරවීමට යාමේදී පාසල නිමවී නිවෙස් වෙත පා ගමනින් යමින් සිටි පාසල් සිසුන් ඇතුළු පිරිසකගේ ගැටී අනතුරක් සිදුව ඇත.

අනතුරින් පාසල් සිසුවියන් සිව්දෙනෙකු හා සිසුන් දෙදෙනෙකු, කාන්තාවන් දෙදෙනෙකු හා පිරිමි පුද්ගලයෙකු තුවාල ලබා තිත්තපජ්ජල හා මහනුවර රෝහල් වෙත ඇතුළත් කර ඇත.

අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර අලදෙනිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**